බැංකොක් වැඩමුළුව හතරවන සැසියඃ 2022 මැයි 8 දින
අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව

අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව යනු කුමක්ද?

වසර 2014 දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර කමිටුව (COFI) මගින් ආහාර සුරක්ෂිතතාවය හා දරිද්‍රතාවය පිටුදැකීමේ සංදර්භය තුල සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ සුරක්ෂිතතාවය සදහා ස්වේච්ඡා මගපෙන්වීම් මාලාව සම්මත කරන ලදී. මෙමගින් මානව හිමිකම් පදනම් කරගත් අතර ඒවා සකසන ලද්දේ ICSF ඇතුළු සිවිල් සංවිධාන වල පුළුල් සහභාගිත්වයෙන් ප්‍රධාන කාර්යය භාරයක් ඉටුකරමිනි.

සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව ක්‍රියාත්මක කිරීම සඳහා දිගුකාලීනව හා පුළුල්ව දායකත්වයක් දැක්වූ පිරිස් අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුවක් දියත් කිරීමටද විශාල උනන්දුවක් දක්වයි. සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව තමන්ගේ අධීක්ෂණය සදහා ක්‍රමවේදය එහි අරමුණු හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිලිබඳව ප්‍රගතිය (13.4 පරිච්ඡේදය) සහ මෙම අධීක්ෂණ ප්‍රයත්නයන් සඳහා සුළුපන්න ධීවරයින්ගේ මැදිහත් වීම (13.5 පරිච්ඡේදය). දියත් කිරීම සොයාබැලීමට අමතරව අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාවේ මූලධර්ම ජයගැනීමට සහ භාවිතයේදී ඇතිවන අඩුපාඩු සොයා බැලීමට සහ එකී අභියෝග ජයගැනීමටත් සහ මෙම මගපෙන්වීම් මගින් ඇතිකරන බලපෑම තේරුම් ගැනීමටත් ඒවායේ සාර්ථකත්වය සහ පුළුල්ව දියත් කිරීමටත් යොදාගත හැක.

වසර 2020 සහ 2021 අතරදී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ WorldFish මගින් සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාවේ ප්‍රධාන තේමාවන් පිලිබඳ සමීප අධ්‍යයනයකින් යුතුව අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව සකසන ලදී. (5 සිට 9 පරිච්ඡේදයන්)

මෙම කෙටුම්පතද අදාල අනෙකුත් අධීක්ෂණ රාමූන් මත පදනම්ව සකසා ඇත. උදාහරණ ලෙස තිරසර සංවර්ධන ඉලක්ක සහ එක්සත් ජාතීන්ගේ ආදිවාසී ජනතාව පිලිබඳ ප්‍රකාශණය ආදියයි. මෙම අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුවේ කෙටුම්පත තුල සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාවේ ප්‍රධාන තේමාවන්ට අදාලවත් සහ බලපෑම් අධීක්ෂණයට අදාල දර්ශක වලිනුත් සමන්විතය. මෙම කෙටුම්පත සමාලෝචනය කර යලි සැකසීමට හා තවත් වැඩි දියුණු කිරීමට විශේෂඥ උපදේශණයන් ගනනාවක් 2021 වසරේදී පවත්වන ලදී.

2022 මාර්තු මස සිට මෙම අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව තවදුරටත් ඔපලා සැකසීමේ හා අවසන් කිරීමේ සහ මෙම රාමුව කෙසේ භාවිතයට ගන්නේද යන්න පිලිබද මගපෙන්වන අත්පොතක් කෙටුම්පත් කිරීමේ කාර්යය ICSF ආයතනය භාරගන්නා ලදී. සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාවේ වටිනාකම මත පදනම්ව මෙම ක්‍රියාවලිය සුළුපන්න ධීවර ක්‍රියාකාරීන්ගේ දායකත්වයද ලබාගත හැකි පරිදි දියත් කරනු ඇත. මෙම ක්‍රියාවලිය නිමාවූ පසුව මෙම අධීක්ෂණ, ඇගයීම සහ ඉගෙනුම් රාමුව භාවිතයට ගනීයැයි අපේක්ෂිත රාජ්‍යයන් හෝ සංවිධාන වඩාත් සහභාගිත්වයෙන් යුතුව ජාතික මට්ටමෙන් සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව දියත් කිරීම සමාලෝචනය කරනු ඇත. මෙම අධීක්ෂණ, ඇගයීම සහ ඉගෙනුම් රාමුව සැකසීමේ අදහස තුල ඇත්තේ සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව දියත් කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සහ කොපමන දුරකට ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේද යන්නත් තවදුරටත් දියුණු කරගත යුතු දුර්වල ක්ෂේත්‍ර මොනවාද යන්නත් හඳුනාගැනීමයි.

සංවාදය සඳහා මගපෙන්වන ප්‍රශ්ණාවලිය

1. ඔබගේ රජය සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව සක්‍රියව දියත් කරන්නේද? ඔබගේ රජය අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව දියත් කිරීම පිලිබඳව ඔබගේ කැමැත්ත කෙබඳුද?
2. ඔබගේ රටේ සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව දියත් කිරීම පිලිබඳව ඔබට ඇති ප්‍රශ්ණ මොනවාද?
3. අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව ක්‍රියාත්මක කරන ක්‍රියාකාරීන්ට මගපෙන්වීම සඳහා අත්පොතක ඇතුලත් කල යුතු ප්‍රශ්ණ මොනවාද?
4. අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් රාමුව, සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාව අධීක්ෂණය කිරීම සඳහා සහායක හා පහලින් ඉහලට දිවෙන කාර්යයක් දියත් කිරීම පිලිබඳව ඔබගේ අදහස කුමක්ද? (උදාහරණ ලෙස ජනතා අධිකරණ ක්‍රියාවලිය)